# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1778/3 - 2012 ඔක්තෝබර් 01 වැනි සඳුදා - 2012.10.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3(2) වැනි උපවගන්තිය යටතේ නිවේදනය

2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3(2) වැනි උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රෝහණ රාජපක්ෂ වන මා, ආයෝජන හා සංචාරක විෂයභාර අමාත්‍යවරයාද ලෙස මා මෙම නිවේදනය මගින් -

1. ක්‍රිස් ගෲප් නමැති ඉන්දියානු සමූහය මගින් බස්නාහිර පළාතේ, කොළඹ 01හි පිහිටි ට්‍රාන්ස්වර්ක්ස් චතුරශ්‍ර භූමියෙහි, ඇමෙරිකානු ඩොලර් මිලියන 449ක් පමණ වන මුළු ආයෝජනයකින් යුතුව ඉදිකෙරෙන මිශ්‍ර උපයෝගිතා සංකීර්ණයක් වන මෙම ව්‍යාපෘතිය, රටට ආර්ථික සහ සාමාජීය ප්‍රතිලාභ හිමිකර දෙන අතර රටේ භූදර්ශනය වෙනස් වීමට ද තුඩුදිය හැකි ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස හඳුනාගනු ලැබේ.

2. ඉහත කී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු දිනය, එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ඇතිකර ගන්නා ලද ගිවිසුමේ සඳහන් දිනය වන අතර, එකී ව්‍යාපෘතිය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමට එළඹි දිනයේ සිට මාස හැටක (60) සිට වාණිජමය ක්‍රියාකාරකම් ආරම්භ වන බවට ප්‍රකාශ කරනු ලැබේ.

3. ඉහත කී ව්‍යාපෘතියෙහි කාර්යය සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යපෘති පනත ප්‍රකාරව, මෙම නිවේදනයේ උපලේඛනයේ දක්වා ඇති නිදහස් කිරීම් මෙම ව්‍යාපෘති සමාගමට අදාළ වන බවට ද නිශ්චිතව දක්වනු ලැබේ.

**උපලේඛනය**

1. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත

    (i) බදු ගෙවිය යුතු ලාභය සමාගම උපයන මුල් වසරේ ආරම්භය සිට හෝ වාණිජමය කටයුතු ආරම්භ කිරීමෙන් වසර තුන (03)කට පසු, කලින් එළඹෙන කවර හෝ වසර සිට වසර දහය (10) කට ආදායම් බදු පනත යටතේ ආයතනික ආදායම් බදු නිදහස් කාල පරිච්ඡේදයක්, ඉන්මතු, නිදහස් කාල පරිච්ඡේදයේ අවසාන දිනයට අනතුරුව එළඹෙන වැඩිපුර ඉක්බිති වසර පහළොව (15)කට සෑම තක්සේරු වසරකටම අදාළ බදු අනුපාතයෙන් අඩක් වන සියයට හයක

ප්‍රතිශතයක (6%) අර්ධ නිදහස් කිරීමක් හිමි වේ. පැහැදිලි කිරීමක් වශයෙන් ඉහත විදහා පෙන්වා දී තිබෙන වසර විසිපහ (25) ඉකුත්වීමෙන් පසුව එවිට බල පවතින සාමාන්‍ය බදු රාමුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම කෙරෙහි අදාළ වනු ඇත.

(ii) එකී වසර දහය (10) ක බදු නිදහස් කාල පරිච්ඡේදය තුළ සහ ඉන්මතු වසර එක (01) කට ලාභ වලින් කොටස්කරුවන්හට බෙදා දෙනු ලබන ලාභාංශ වලට ආදායම් බදු නිදහස ලැබේ.

(iii) සමාගමේ උපරිම ප්‍රවාසික සේවකයින් සංඛ්‍යාව විස්ස (20)කට වසර පහ (05)ක කාලයකට උපයන විට ගෙවිය යුතු බදු නිදහස අදාළ වනු ඇත.

(iv) පහත සඳහන් විෂයන් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීමෙන් සමාගමට නිදහස ලැබේ.

(අ) ප්‍රාග්ධන වියදම් සඳහා ලබාගත් විදේශ ණය මත පොළිය

(ආ) බදු සහන කාල පරිච්ඡේදය තුළ උපදේශකයින්ට ගෙවන ලද තාක්ෂණික ගාස්තුව

2. *2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත*

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතියට අදාළ භාණ්ඩ ආනයනය කිරීම සහ ව්‍යාපෘතියට අදාළ දේශීය වශයෙන් මිළදී ගනු ලබන භාණ්ඩ සහ සේවාවන් මත එකතු කළ අගය මත බදු ගෙවීම

3. *2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන අයකිරීම් පනත*

ව්‍යාපෘතිය ඉදිකිරීම් කාලය තුළ වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන අයකිරීම් වලින් නිදහස් වේ.

4. *(235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනත*

ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් වලට පමණක් ආනයනය කරනු ලබන ද්‍රව්‍ය සම්බන්ධයෙන්, ඉදිකිරීම් කාලය තුළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගම නමින් ආනයනට කෙරෙන සියළු ප්‍රාග්ධන භාණ්ඩවලට රේගු බදු අයකිරීම් වලින් නිදහස් කිරීම් අදාළ වේ.

5. *2005 අංක 5 දරන මුදල් පනත*

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ/ඉදිකිරීම් කාලය තුළ ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් අය කිරීම් සහ ගෙවීම් වලින් නිදහස් කෙරේ.

බැසිල් රෝහණ රාජපක්ෂ, පා. ම.
ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2012 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10-657

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.